## බළන්ගොඩ නගර සභාව

## 2025.11.11 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.11.11**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2025-10-14 දිනැති මහා සභා වාර්තාව සහ 2025-10-27 දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් 2025-10-14, 2025-10-27 දිනැති මහා සභා වාර්තාවන් සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, 2025-10-27 දිනැති සභාවේ සභා වාර්තාවේ පෞද්ගලික මන්ත්‍රී පැහැදිලිකිරීම් වලදී තමාගේ කතාවේ හර්ෂණ මන්ත්‍රීතුමා අතින් ද්වේශසහගත වචනයක් පිටවූ බවට තමා පැවසූ බවට සඳහන් කර ඇතත් එය අදාළ නොවන වචනයක් ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී. ඒ අනුව 2025-10-14 දිනැති මහ සභාවේ සහ 2025-10-27 දිනැති මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**පෙ.ව.10.06ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අදදින නිවේදන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අසනීප තත්වයක් හේතුවෙන් සභාවට නොපැමිණෙන බවත්, ඒ අනුව නිවාඩු අනුමත කර දෙන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදී.ඒ අනුව එතුමියගේ නිවාඩු ඉල්ලීම ගරු සභාව විසින් අනුමත කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, පසුගිය දිනක වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ හදිසි අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන බවත්, ඒ වෙනුවෙන් සභාවේ සියළුම

සභිකවරුන්ගේ ශෝකය පළ කිරීම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් ලබා දෙන ලෙසත් පවසන ලදුව ගරු සභාව ශෝකය පළ කිරීම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලදී.

අනතුරුව අදහස් දැක්වූ ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමා පැවසුයේ සභිකයන් ලෙස වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධව ශෝකය ප්‍රකාශ කරන බවත්, එමෙන්ම සභිකයන්,සභාපතිවරු ලෙස යම් යම් චෝදනා වලට ලක්වන අයවලුන් තෝරා පත් කිරීමේදී ඒ සම්බන්ධව පක්ෂ නායකතුමන්ලා සැලකිලිමත් විය යුතු බවත්, දැනටමත් සිටින සහ හිටපු බොහෝ අයවලුන් චෝදනාවලට ලක්වන බවත්, ඉදිරියේදී හෝ අපේක්ෂකයන් ලෙස තෝරාපත්කිරීමේදී එවැනි දේවල් නොවීමට නායකත්වයන් දැනුවත් කිරීමටත් යෝජනා කරන බවත් පැවසීය.

**පෙ.ව.10.11ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

❖ බළන්ගොඩ මිරිස්වත්ත මුස්තාපා මාවත වසර 10කට අධික කාලයකට පසු අළුත්වැඩියා කිරීම සඳහා ස්තූතිය පළකිරීම සම්බන්ධවත් එම මාර්ගයේ දැනට මීටර් 200 ක් පමණ දුර ප්‍රමාණයක් අළුත්වැඩියා කර ඇති බවත්, තව දුරටත් එම මාර්ගයේ ඒ.අයි.අක්බාර් අලි මහතාගේ නිවස දක්වා මීටර් 100 ක පමණ දුර ප්‍රමාණය ඉතා අබලන් බැවින් අළුත්වැඩියා කරදෙන ලෙසත් දන්වමින් මුස්තාපා මාවත පදිංචිකරුවන් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පැවසුයේ මුස්තාපා මාවත ප්‍රදේශවාසියෙකු විසින් එම මාර්ගයට යොදා ඇති ABC ඇතිවූ වර්ෂාපතනය හේතුවෙන් බෝක්කුවකින් වතුර පිටාර ගැලීම හේතුවෙන් සෝදාපාලුවට ලක්වී ඇති බවත්,නැවත ප්‍රතිසංස්කරණය වන මට්ටමට ලක්ව ඇති බවත් පැවසූ බවත්,ඒ අනුව වැඩ අධිකාරි මහතා නැවත පරීක්ෂා කිරීමක් සිදු කරන ලෙසත්ය.

ඒ අනුව මෙම මාර්ගයේ තත්වය පිළිබඳව වැඩ අධිකාරී මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

වර්ෂ 10කින් පමණ මෙම මාර්ගය නඩත්තු කර නොමැති බව වැරදි බවත්, චමික සභාපතිතුමා මෙන්ම වසන්ත සභාපතිතුමාගේ පාලන කාලවලදී තමන් ඉල්ලීම් කර මෙම මාර්ගය නඩත්තු කිරීම් සිදුකළ බවත්, නමුත් මේ තරම් ප්‍රතිපාදන ප්‍රමාණයක් නොලැබුන බවත්, විධිමත් කාණු පද්ධතියක් නොමැති බැවින් මෙලෙස හානි සිදුවන බවත්, කාණු පද්ධතියක් සකස් කිරීම කළ යුතු බවත් වසර 10කින් පමණ සුබයිර් අලීම් මාවත අළුත්වැඩියා කිරීම් නම් සිදුකලේ නොමැති බවත්,එහි කාණු පද්ධතිය

සකස් කර ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසීය.ගරු සභාපතිතුමන් පැවසුයේ මුස්තාපා මාවත ඉතිරි කොටස සහ කාණු පද්ධතිය සකස් කිරීමට ඉදිරියේදී පියවර ගන්නා බවයි.

❖ බළන්ගොඩ නගර සභාව සතු තානායම නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරාගෙන නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවත්නා ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් යන ආයතනය වෙත ලබා දීම සම්බන්ධව 2025.10.27 දිනැතිව ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනය යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ගරු සභාපතිතුමා ඉදිරිපත් කළ ලිපිය සභාවෙන් යොමුකළ ලිපියකට පිළිතුරු ලිපියක් බවත්,ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තානායම් පවරාගැනීම සම්බන්ධව කැබිනට් අනුමැතියකින් ලද තීරණයක් පැවතියද සභාව මඟින් ලිපි යොමුකර ඒ පිළිබඳ විමසීම මඟින් මෙලෙස පවරාගැනීම සම්බන්ධව තවදුරටත් පැහැදිලි කරමින් එම සමාගම ලිපි යොමුකර ඇති බවත් පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ මේ පිළිබඳ විෂයභාර ඇමතිතුමා සහ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සමඟ දුරකථනයෙන් සාකච්ඡා කළ බවත් මෙම පවරාගැනීම ස්ථිර වශයෙන්ම සිදු කරන බව සහ සභාව මේ වන විට තානායම අළුත්වැඩියා කිරීමට දරා ඇති පිරිවැය නැවත සභාව වෙත ලබා දීමක් සිදු කරන බව පැවසූ බවත්ය.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා සහ ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම කරුණු ලිඛිතව සභාව වෙත දැන්වීම සිදු කළ යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා පැවසුයේ ගරු ජනාධිපතිතුමා බණ්ඩාරවෙලදී මෙම පවරාගැනීම් සිදුකර පෞද්ගලික අංශයට භාර දෙන බව බව පැවසූ බවත්, එබැවින් දැන් මේ පිළිබඳව විවාද කිරීම ඵලක් නොමැති බවත් පැවසීමත් සමඟ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ, එහිදී ගරු ජනාධිපතිතුමා සඳහන් කළේ පාඩු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය බවත්, සභාව සතු තානායම යනු ලාභ ලබන ආයතනයක් බවත්ය. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, එහිදී ඌන උපයෝජනය ආයතන පිළිබඳව ගරු ජනාධිපතිතුමා පැවසූ බවත්, නමුත් මෙම තානායම ලාභ ලබන ආයතනයක් බවත්, මෙම තානායම හිටපු සභාපතිතුමන්ලාගේ වැයමෙන් සභාවට පවරා ගෙන ඇති බවත්, සභාවේ මෙම වර්ෂයේ සිට වැටුප් ගෙවීම වෙනුවෙන් 20%ක මුදලක් වැය කිරීමටත්, ඊළඟ වර්ෂයේ සිට එය දෙගුණ වන බවත්, එවිට එම පිරිවැය කළමණාකරණය කෙසේද යන්නත් ,මෙලෙස සභාව සතු ලාභ ලබන ආයතන පවරාගැනීමට ඉඩ ලබා දීම නොකළ යුතු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසුයේ සභාව වෙත තානායම පවරාදෙන්නේම් එයට තමන්ද කැමති බවත්, නමුත් පෞද්ගලික අංශය සමඟ තරඟකාරීව ක්‍රියාකිරීමට රාජ්‍ය අංශයට නොහැකි බවට රාජ්‍ය ප්‍රතිපත්තියක් පවතින බවත්, මෙය පෞද්ගලික අංශයට පවරාගෙන කිරීමේදී තිබෙන තත්වයට වඩා දියුණු තත්වයකින් පවත්වාගෙන යනු ඇති බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසුයේ සභාව මඟින් තානායම පවත්වාගෙන යාම නොව එය ටෙන්ඩර් කර ලබා දෙන්නේද පෞද්ගලික අංශයට බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ මලීක්ෂා මැතිතුමාට මේ පිළිබඳව කරුණු පැහැදිලි කර දිය යුතු බවත්, 1997 වර්ෂයේදී මෙම තානායම සභාව වෙත පවරාගැනීමේදී ලංකාවෙන්ම තානායම් 03ක් පමණක් එලෙස සභාවන් වෙත පවරාගත් බවත් අනෙකුත් සියල්ල නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරාගත් බවත්, තර්ක කර මේ පිළිබඳව කතා කරලා වැඩක් නෑ යන්න පැවසිය නොහැකි බවත්, එවකට සිටි සභාපතිවරුන්ගේ දක්ෂතාවය මත මෙය එලෙස පවරාගත් බවත්, නමුත් මෙම සභාව විසින් ආපසු නාගරික සංවර්ධන අධිකාරිය වෙත තානායම පවරාගැනීමට දෙන්නේනම් එලක් නැති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ සභාපතිතුමාගෙන් මේ පිළිබඳව සාකච්ඡාවක් ඉල්ලුම්කළද එම සාකච්ඡාව නොතිබූ බවත් එම සාකච්ඡාවට මත්තෙන් තානායම පවරාගැනීම පිළිබඳව මෙලෙස ලිපි පැමිණියේ කෙලෙසද යන්නත්, තානායම ලාභ ලබන ආයතනයක් බවත්, වත්මන් රජය රාජ්‍ය දේපළ විකිණීම සිදු නොකරන බව පැවසූ නමුත් දැන් මෙලෙස සිදු කරන්නේ කුමක්ද යන්නත්ය.

මෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ගනුදෙනු කිරීමේදී සැලකිලිමත් විය යුතු බවත්,බස් නැවතුම්පොළ ඉඩම් හුවමාරුවේදීද ගැටළුවක් සිදු වී ඇති බවත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු සභාපතිතුමා මෙහිදී කරුණු පැහැදිලි කරමින් පැවසූයේ පසුගියදා පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගරු ජනාධිපතිතුමා රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස ව්‍යාපාර කිරීමට රජයේ ආයතන යොදා නොගන්නා බවත් ඊට වඩා වැඩි කාර්යක්ෂමතාවකින් වැඩි ඵලදායිතාවයකින් පුද්ගලික අංශයේ ආයතනවලට එම ව්‍යාපාර කිරීමේ හැකියාව ලංකාවේ පෙර නොපැවතියද වර්තමානයේ එම හැකියාව පුද්ගලික අංශය සතුව පවතින බවත් පැවසූ බවත්ය. තවදුරටත් ගරු සභාපතිතුමා පැවසූයේ මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ ඉල්ලීම මත විශේෂ සභාවක් ලබා දිය හැකි බවත්, එහිදී සාකච්ඡා කර පොදු තීරණයක් ලබා ගත හැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ වර්තමාන රජය ක්‍රියාත්මක කරන්නේ IMF කොන්දේසි බවත්, එම කොන්දේසී වල රාජ්‍ය අංශය ව්‍යාපාර නොකිරීම ඇතුළත්

බවත්, නමුත් තානායම සභාව සතුව තිබියදී පුද්ගලික අංශයට ව්‍යාපාර කටයුතු කිරීමට ලබා දිය හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා මෙහිදී පැවසුයේ බළන්ගොඩ තානායම විශාල ඉතිහාසයකට හිමිකම් කියන බවත්, සභාවට මතු වී ඇති ආදායම සම්බන්ධ ගැටළුවේදී අනිවාර්යෙන් මෙය රැකගැනීම කළ යුතු බවත්, පුද්ගලයෙකුට මෙය පිරිනැමීම වෙනුවට හෝටල් සමාගමකට පිරිනැමීම වැදගත් බවත්, මෙය නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන ඒ හරහා හෝටල් සමාගමට ලබා දීම වෙනුවට බළන්ගොඩ නගර සභාව සතුව තිබියදීම සභාව හරහා එම හෝටල් සමාගමටම දීමේ හැකියාවක් පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසුයේ ඉහත මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය නිවරදි බවත්,එතුමාද පවසන ආකාරයට නගර සභාව හරහා එම හෝටල් සමාගමට තානායම ලබා ගැනීමේ හැකියාව පවතින බවත් එවිට සභාවට කුලී ආදායම ලැබෙන බවත්, සභාවේ තීන්දු තීරණ බලවත් බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ තමන් පුද්ගලිකවමද සභාව සතු තානායම පවරා ගැනීමට විරුද්ධ බවත්,ඉදිරියේදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ තානායම පිළිබඳ යෝජනාවක් අදදින පවතින බැවින් ඒ පිළිබඳ තීරණයක් එම යෝජනා අවස්ථාවේදී ලබා ගත යුතු බවයි.

- ❖ බළන්ගොඩ නගරයේ ඇති ත්‍රීරෝද රථ නැවතුම්පලවල් විධිමත් කිරීම යන මැයෙන් බළන්ගොඩ නගර සභාව , බළන්ගොඩ පොලිසිය, වෙළඳ සංගමය සහ රත්නපුර දිස්ත්‍රික් ත්‍රීරෝද රථ සංගමය එක්ව 2024 වර්ෂයේදී ගත් තීරණයක් මත නගරය තුළ ඇති ත්‍රීරෝද රථ නැවතුම් පලවල් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය පුවරු සකස් කර ස්ථාපිත කර ඇති බවත්, ඉදිරි වැඩකටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමට ත්‍රීරෝද රථ නැවතුම්පළකින් දෙදෙනෙකු බැගින් සහභාගී කර ගනිමින් සාකච්ඡා කිරීමට දිනයක් හා වේලාවක් ලබා දෙන ලෙසත් රත්නපුර දිස්ත්‍රික් ත්‍රීරෝද රථ සංගමය යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
  ගරු සභාපතිතුමන් මෙහිදී පැවසුයේ බළන්ගොඩ පොලිසිය, වෙළඳ සංගමය ගෙන්වා සාකච්ඡා කිරීම සුදුසු බවයි.

- ❖ සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය බෙදුම්කාරීත්වය දරනු ලබන තුඹගොඩ ඉන්ධන පිරවුම්හල මඟින් සභාව මීට පෙර ඉන්ධන පහසුකම් සලසා ගැනීමේ කටයුතු සිදු කළද මුද්‍රිත බිල්පතක් නිකුත් නොකිරීම හේතුවෙන් ඉන්ධන ලබා ගැනීම නතර කර ඇති බවත්, නමුත් රට තුළ ඉන්ධන හිඟයක් පැවති වකවානුව තුළ හා කොරෝනා සමය තුළ තුඹගොඩ පිරවුම්හල මඟින් අඛණ්ඩව ඉන්ධන සැපයීම සිදු කළ බවත්, මේ වන විට මුද්‍රිත බිල්පත් ලබා ගැනීමේ හැකියාව පවතින බැවින්

සක්‍රීයව ඉන්ධන ලබා ගැනීමේ කටයුතු සිදු කරන ලෙසත් ඉල්ලීම් කරමින් සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, මෙම ඉන්ධන පිරිවුම්හල මඟින් ඉන්ධන ලබා ගැනීම නතර කර ඇත්තේ සභාවේ අඩුපාඩුවක් නිසා නොව ඔවුන්ගේ අඩුපාඩුවක් හේතුවෙන් බවත්,කොරෝනා සමය තුළ රාජ්‍ය ආයතන වලට ඉන්ධන ලබා දීමට බැඳී සිටි බවත්, මෙම ඉල්ලීම පිළිබඳ සලකා බැලීම සාධාරණ බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමන් මෙහිදී පැවසුයේ දැනටත් මෙම ඉන්ධන පිරවුම්හලින් භූමිතෙල් ලබා ගැනීම සිදු කරන බවත්, මෙම ඉල්ලීම සලකා බලා සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය මඟිනුත් ඉන්ධන ලබා ගැනීම සුදුසු බවත්ය.

මෙම ආයතනයේ ඉල්ලීම සලකා බලා මෙම ආයතන මඟින් ණය කාල සීමාව පිළිබඳ විමසීමක් සිදු කර ඉන්ධන ලබා ගැනීමේ කටයුතු සිදු කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

❖ පළාත් පාලන බල ප්‍රදේශයට අදාළව ව්‍යාපාර ක්ෂේත්‍රයේ නිරත වන ව්‍යවසායකයන්ගේ සංවර්ධන කාර්යයන් සඳහා ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන බවත්,රජයේ හඳුනාගනු ලැබූ මූල්‍යායතන හරහා මෙම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන අතර සරල ණය කොන්දේසි හා අඩු පොලී ප්‍රතිශතයන්ද සහන කාලයන් මත මෙම ණය නිකුත් කරනු ලබන බවත්,ආයතනයේ මහජන නියෝජිතයන් මඟින් හඳුනාගනු ලැබූ ව්‍යවසායකයින් උක්ත වැඩසටහන සඳහා සම්බන්ධ කළ හැකි බවත්,අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරින් මේ සඳහා පත්කර ඇති බවත් අදාළ යොමුකිරීම් සිදු කරන ලෙසත් දන්වමින් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ රත්නපුර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් යොමු කර ඇති ලිපිය ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමන්, ඉහත කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ දැනුම් දීම පරිදි ඊට අදාළ වන තමන්ගේ කොට්ඨාශයන්හි ව්‍යාපාර ක්ෂේත්‍රයේ නිරත වන ව්‍යවසායකයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත දැනුම් දෙන ලදී.

❖ 2026 වර්ෂයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා 2026 වර්ෂයේ ජනවාරි මස සිට 2026 මාර්තු මාසය දක්වා දිනයන් වෙනුවෙන් බළන්ගොඩ මහජන ක්‍රීඩාංගනය වෙන් කර ගැනීම සඳහා ර/විද්‍යාලෝක මධ්‍ය මහ විද්‍යාලය විදුහල්පති යොමුකර ඇති ඉල්ලීම් ලිපිය ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙම ඉල්ලීම සඳහා ක්‍රීඩා පිටිය ලබා දුනහොත් වෙනත් පාර්ශව සඳහා කුලී පදනම මත ක්‍රීඩාපිටිය ලබා දීමේ හැකියාවක් නොපවතින බවත්, එබැවින් ලබා ගත හැකි ආදායමද ඇහිරී යන බවත් පවසන ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසූයේ ර/විද්‍යාලෝක විද්‍යාලය වැනි පාසල් සඳහා ක්‍රීඩාංගණයක් නොමැති බැවින් ආදායම පිළිබඳවම සලකා බැලීම සිදු නොකර එම අවස්ථාව ලබා දිය යුතු බවයි.

ගරු සභාපතිතුමන් මෙහිදී පැවසූයේ සභාව පත් වීමට පෙරාතුව ක්‍රීඩා පිටිය රාජ්‍ය ආයතනවලට ලබා දීමේදී නියමිත කුලී ගාස්තුවෙන් අඩක් අයකර ලබාදීමට තීරණයක් ලබාගෙන තිබෙන බවත්, නමුත් ක්‍රීඩා පුහුණුවීම් කටයුතුවලට අයකිරීමක් සිදු නොකරන බවත්ය.ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා, අඩක් හෝ අයකර ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බවත්, ඉදිරියේදී වෙනත් ආදායම් ලබා ගැනීමට හැකිවේවි යැයි සලකා නොදී සිටීමද පාඩුවක් විය හැකි බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ විදුහල්පතිතුමා දැනට ඉල්ලුම් කර ඇති දින කීපය ලබා දීමේ හැකියාවක් පවතීනම් ලබා දීම සුදුසු බවත්, බොහෝ ආයතන සති අන්තයේ දින ක්‍රීඩා පිටිය වෙන්කිරීම් සිදුකරන බැවින් සතියේ දිනවල ඉල්ලුම් කර ඇති ක්‍රීඩා පුහුණුවීම් වෙනුවෙන් ලබා දීම සුදුසු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ තමන් ක්‍රීඩා ගුරුවරයෙක් ලෙස, බළන්ගොඩ විද්‍යාලෝක විද්‍යාලය දක්ෂ ක්‍රීඩා ගුරුවරුන් බිහිකරන පාසලක් බවත්, ක්‍රීඩාව යනු පාසල් දරුවන්ට අත්‍යවශ්‍ය දෙයක් බවත්, බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පාසල් 08ක් පමණ පවතින බවත්, එයින් පාසල් 03කට පමණක් ක්‍රීඩා පිටි පවතින බවත්, මෙම ඉල්ලීම සලකා බලා මුදල් අය කිරීමකින් තොරව ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බවත්, මීන් පෙර සභාවාරවලදීද එසේ ලබා දුන් බවත්ය.

ගරු සභාපතිතුමන් මෙහිදී පැවසූයේ ගරු ආණ්ඩුකාරතුමිය සමඟ සිදුකළ සාකච්ඡාවේදී එතුමියද පැවසූයේ පළාත් පාලන ආයතනයක් යනු පුණ්‍ය ආයතනයක් නොවන බැවින් නොමිලේ සපයනු ලබන සේවාවන් ලබාදීම සීමා කරන ලෙස උපදෙස් ලබා දුන් බවත්, නමුත් සභා සම්මුති මඟින් එලෙස අත්‍යවශ්‍යම කාරණා වෙනුවෙන් ලබා දිය හැකි බවත්ය.නමුත් පාසල් වලට අයවැය මඟින් මෙලෙස වැය දැරීමට මුදල් වෙන් කරන්නේ ඉතාම සීමිත ප්‍රමාණයක් බවත්, ඒ අනුව සභාපතිතුමා ත්‍යානායම පවරා ගැනීමට ඉඩ ලබා දෙන්නේ නම් මෙය ලබා දීම ඉතා සුළු දෙයක් බවත් පවසන ලදී.
මේ අවස්ථාවේදී ක්‍රීඩා පිටිය ලබා දීම පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් ඇති විය.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසූයේ රාජ්‍ය ආයතනවලට ක්‍රීඩා පිටිය ලබා දෙන්නේ ගාස්තුවලින් අඩක් අයකරන බැවින් ක්‍රීඩා පුහුණුවීම් සිදු කරන දිනයන් හැර ක්‍රීඩා ඉසව් පැවැත්වෙන දිනයන් සඳහා ක්‍රීඩා පිටි ගාස්තුවෙන් අඩක් අයකර ලබා දීම සුදුසු බවට පවසන ලදුව ඒ ආකාරයට ලබා දීමට සභාව තීරණය කරන ලදී.

- ❖ බළන්ගොඩ වීරසුන්දාරාරාම මාවතේ ඇති කඩ පේළියේ ඉවත දමන කුණු කසළ දැමීම සඳහා භාජන කීපයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරමින් කඩ හිමියන් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
 මෙහිදී ගරු සභාපතිතුමන් සඳහන් කලේ මෙවැනි ඉල්ලීම් පරිදි කසළ බඳුන් ලබා දුනහොත් නගරයේ සියල්ලන්ම එලෙස ඉල්ලීම් කරන බවත්, එබැවින් එම කඩ හිමියන්ගේ ප්‍රාග්ධනයෙන් විශාල ප්‍රමාණයේ බැරල් දෙකක් තබා කසළ වෙන් කර දැමීමට කඩ හිමියන් දැනුවත් කිරීම සුදුසු බවත්ය.

- ❖ බළන්ගොඩ නගර සභාව විසින් පවත්වා ගෙන යනු ලබන බොම්බුව හා වැවවත්ත පෙර පාසලෙහි සේවයෙහි නියුතු පෙර පාසල් ගුරු දෙදෙනාට ලබා දෙන රු.15,000 දීමනාව රු.25,000 දක්වා වැඩි කර දෙන ලෙස යොමු කළ ඉල්ලීමට අනුව ඊට අදාළ 2021.03.09 දිනැති ප.පා.කො චක්‍රලේඛ 01/2021 සංශෝධනය කිරීම සඳහා ඉල්ලීමක් යොමු කර ඇති බවත්, එකී ඇනුමැතිය ලද පසු මේ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වමින් පළාත් පාලන කොමසාරිස් යොමු කර ඇති 2025.10.07 දිනැති CLG/LG/3/11/6 අංක දරණ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

- ❖ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ තාවකාලික වෙළඳ බලපත්‍ර ලබා දීම පිළිබඳව සලකා බලන ලෙස දන්වමින් බළන්ගොඩ වෙළඳ සංගමය යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.ගරු සභාපතිතුමන් විසින් මෙහිදී අදහස් දක්වමින් පැවසුයේ ඉහත වෙළඳ සංගමය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම මඟින් යොමුකර ඇත්තේ කිරිමැටිතැන්න ප්‍රදේශයේ ආරාධ්‍යා ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් හේතුවෙන් බළන්ගොඩ කඩ හිමියන්ට අසාධාරණයක් වන බව සහ එම ව්‍යාපාරයට ලබා දී ඇති තාවකාලික වෙළඳ බලපත්‍රය පිළිබඳව බවයි.නමුත් මෙම ස්ථානයට වෙළඳ බලපත්‍රය ලබා දී ඇත්තේ ගොඩනැගිලි හිමිකරුට බවත්, මෙම ගැටළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික මිනිස් අයිතිවාසිකම් සමඟ ගැටෙන බැවින් නීතිමය වශයෙන් බලපෑමක් සිදු කළ නොහැකි බවත් ඒ අනුව අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, මෙම සේල් ව්‍යාපාරය හේතුවෙන් බළන්ගොඩ නගරයේ ව්‍යාපාරිකයන්ට මරු පහරක් එල්ල වී ඇති බවද, මෙය පැවැත්වීම සඳහා රත්නපුර, ඇඹිලිපිටිය, බණ්ඩාරවෙල ආදී නගරවලින්ද ඉල්ලීම් කළ නමුත් එම නගරවලින් ඊට අවසර ලබා දී නොමැති බවත්,බළන්ගොඩ නගර සභාවෙන් පමණක් ඒ සඳහා අවසර ලබා දී ඇති බවත්, ගොඩනැගිල්ලට වෙළඳ බලපත්‍රයක් ලබා දී ඇත්තේ උත්සව ශාලාවට බවද, මෙම ව්‍යාපාරය සඳහා වෙනම බලපත්‍රයක් ලබා දී ඇති බවද, මූලික අයිතිවාසිකම් හා සැලකීමේදී ගැටළුවක් වුවද බළන්ගොඩ ව්‍යාපාරික ජනතාවගේ පැත්තෙන් මෙය ඉතා සංවේදී කාරණාවක් බවද ,සභාවේ සෑම දෙයකටම

සිටින්නේ බළන්ගොඩ ව්‍යාපාරික ජනතාව බවද,දෙසැම්බර් මාසය වන විට නාගරික සංවර්ධන අධිකාරි ඉඩමේද මෙවැනි පොත් සේල් ව්‍යාපාරයක් පැවැත්වෙන බවද එයද බළන්ගොඩ නගරයේ ව්‍යාපාරිකයන්ට බලපෑමක් විය හැකි බවත්, ඉහත වෙළඳ සංගමයේ ලිපිය පිළිබඳ අදහස් දක්වමින් පැවසීය.

මෙහිදී ගරු සභාපතිතුමන් පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමිය වෙත එම පොත් ප්‍රදර්ශනය පැවැත්වුවහොත් බළන්ගොඩ ව්‍යාපාරික ජනතාවට සිදුවන පාඩුව පිළිබඳව දැන්වීම සුදුසු බවයි.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා අදහස් දක්වමින් පසුගිය වර්ෂයේදීද එම පොත් ප්‍රදර්ශනය පැවැත්වූ බවත්,එම අවස්ථාවේදී වෙළඳ සංගමය එය නැවත නොපැවැත්වීමට කටයුතු කරන ලෙස දන්වා ලේකම්තුමියට ලිපියක් ලබා දුන් බවත්, ඒ අනුව එම පොත් ප්‍රදර්ශනය පැවැත්වීම පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බවත් පවසන ලදී.

වර්ෂ අවසානයේ පාසල් දරුවන් වෙනුවෙන් පොත් ලබා ගැනීමට දෙමව්පියන් වෙත විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවන් එවැනි අවස්ථාවක අඩු පිරිවැයකට පොත් ලබා ගත හැකිනම් එම අවස්ථාව නැති කිරීම සුදුසු නොවන බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසන ලදී.

- ❖ මහජන පොළ ආපනශාලාවේ විදුලි මීටරය නිතර නිතර අක්‍රිය වන බවත් ඒ තුළින් විදුලියද වරින් වර විසන්ධි බවන බවත් එම ගැටළුව නිරාකරණය කර දෙන ලෙස පොළ ආපනශාලා භාරකරු යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී. මෙහිදී විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු බවට තීරණය විය.

- ❖ බළන්ගොඩ රෝහල් භූමියේ මායිම් සඳහා නිසි පරිදි සකස් කරන ලද වැටක් නොමැති වීමෙන් අයාලේ යන සුනඛයන් රෝහල් භූමියේ තුළට ගෙනවිත් දැමීම සහ අයාලේ යන ගවයන් රෝහල් භූමියට පැමිණීම නිසා ජලනල පද්ධතිය කැඩී බිඳී යන බවත්, රාත්‍රී කාලයේ නාඳුනන පුද්ගලයන් රෝහල් භූමියට ඇතුල්වීම වැනි ගැටළු ඇති වී ඇති බවත්, ඒ සඳහා උළු යොදා ගනිමින් වැටක් ඉදිකිරීමට යෝජනා කර ඇති බවත්, එම වැට ඉදිකරන කොටසේ කපන ලද මහෝගනී ගස්වල විශාල මුල් කීපයක් තිබීම හේතුවෙන් බාධා ඇති වීම හේතුවෙන් ජේ.සී.බී යන්ත්‍රය මඟින් එම මුල් ඉවත් කිරීමේ කාර්යය සිදු කර දෙන ලෙස වෛද්‍ය නිලධාරී, මූලික රෝහල බළන්ගොඩ මඟින් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසුයේ මෙය නිරීක්ෂණය වෙනුවෙන් බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු යැවූ බවත් එය පැය 05පමණ කාලයක් ගතවන බව පැවසූ බවත්, මෙය කොන්ත්‍රාත්කරුවෙකු හරහා සිදුකරන

කර්මාන්තයක්ද යන්න විමසිය යුතු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ මෙම ඉල්ලීම රෝහල් කමිටුව හරහා පැමිණිය යුතු බවයි.

❖ SM Event Management ආයතනය මඟින් 2025-11-08 දින සිට 2025-11-16 දින දක්වා පැවැත්වීමට නියමිත Ice Cream Festival වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය පැවැත්වීමට දෙහිගස්තලාව BMC පෞද්ගලික ඉඩමේ ක්‍රීඩාංගණය ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙස යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.මීට අදාළව විනෝද බදු මුදල අයකර අවසර ලබා දීම සිදු කළ යුතු බව සභාව තීරණය කරන ලදී.

❖ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්වරුන්ට සහභාගීවීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ඒ සම්බන්ධව කරුණු පැහැදිලි කළ ගරු සභාපතිතුමන් පැවසුයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2025.09.01 දිනැති අංක 3/2025 දරණ චක්‍රලේඛය ප්‍රකාරව මේ සම්බන්ධව උපදෙස් ලබා දී ඇති බවත්,එමඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල සභාපති/උප සභාපති ධූරය හිමි කණ්ඩායමට අයත් නොවන සභාව නියෝජනය කරන නියෝජිතයන් දෙදෙනෙකුට සහභාගීවීමට ඉඩ ලබාදීමට හැකියාව පවතින බව දන්වා ඇති බවත් පැවසීය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා, තමන් නියෝජනය කරන කොට්ඨාශය වන ඕලුගංතොට කොට්ඨාශය බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට මෙන්ම ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන බැවින් ඉඹුල්පේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වීමට තමාට සහ ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමාට අවස්ථාව සලසා දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීම කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමන් පැවසුයේ ඊට අදාළව ඉල්ලීම් ලිපියක් ලබා දෙන ලෙසත් ඉන් පසු අදාළ ඉල්ලීම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ හැකි බවත්ය.

අවුරුදු විසි ගණනක් තමන් බළන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කළ බවත්,සියළුම මන්ත්‍රීවරුන් එයට සහභාගී වූ බවත්, එම කාලයන්හි සංවිධානය කිරීමේදී තිබූ ඉඩ ප්‍රමාණය දැන් සීමිත වන්නේ ඇයිද යන්නත්, ජනතාවගේ ගැටළු සාකච්ඡා කිරීමට සියළුම මන්ත්‍රීවරුන් වෙත එයට සහභාගී වීම සඳහා ගරු සභාපතිතුමා මැදිහත්වී එම අවස්ථාව ලබා දෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ සියළුම පක්ෂ නියෝජනය වන පරිදි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඊළඟට පැවැත්වෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට පෙර ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම්දෙන බවයි.

❖ මාර්ග ඉදිකිරීම් කාර්යයක් වෙනුවෙන් සභාව සතු මෝටර් ග්‍රේඩරය කුලී පදනම මත ලබා දෙන ලෙස Liyanage Contractors, No 56, Main Street, Balangoda යන ආයතනය යොමු කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ඒ අනුව මේ සම්බන්ධව වැඩ අධිකාරි මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාවේ මතය පරිදි ඉහත කාර්යය සඳහා වැයවන පැය ගණනට අදාළ කුලී ගාස්තු සහ ආරක්ෂිත ඇප තැන්පතු මුදලක් ලබා ගෙන ගිවිසුම්ගතව මෝටර් ග්‍රේඩරය කුලී පදනම මත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

❖ ඇල්ලෙඅරාව, බළන්ගොඩ,එක්සත් මාවතෙහි ජීවත් වන පවුල් 20ක පමණ ප්‍රමාණයකට ජලය ලබා ගැනීමට ප්‍රමාණවත්, විධිමත් ක්‍රමාවේදයක් නොතිබූ බවත්, එබැවින් ප්‍රදේශවාසීන් හා එක්ව නළ ළිං පද්ධතියක් සකස් කරගත් බවත්, එයින් ජලය බෙදා දීම සඳහා ලීටර් 10000 පමණ ජල ටැංකියක් සහ නිවෙස් වෙත ජලය බෙදාදීම සඳහා ජලනල පද්ධතියක් අවශ්‍යව ඇති බවත්, ඒ සඳහා විශාල මුදලක් වැය වන බවත්, ඒ සඳහා ජල ටැංකියක් සහ ජලනල පද්ධතියක් ලබා දෙන ලෙසත් ගම්වාසීන් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඇල්ලෙඅරාව එක්සත් මාවතේ මෙම ජල ගැටළුව වසර ගණනක් තිස්සේ පවතින බවත්, ඕලුගංතොට පුංචිපාලම උඩ කොටසට ජල සම්පාදන මණ්ඩලයෙන්වත් ජල සැපයුම ලබා දී නොමැති බවත්, එබැවින් ජල හිඟ කාලයට ජල බවුසරය මින් පෙර සභාවන්වලදීනම් නොමිලේ ලබා දුන් බවත්,නමුත් මෙම සභාවෙන් එලෙස ලබා නොදෙන බවත්,ජනතාව එකතු වී විශාල පිරිවැයක් වැයකර නළ ළිඳක් සකස් කරගෙන ඇති බවත්, ජලය ගබඩා කර තබා ගැනීම වෙනුවෙන් ජල ටැංකියක අවශ්‍යතාවය පවතින බවත්, එම ජනතාවද සභාව වෙත බදු ගෙවන ජනතාව බැවින් මෙම ගැටළුව පිළිබඳ සලකා බලන ලෙසත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ කුමාරගම කොට්ඨාශයේ මෙවැනි ජල ගැටළුවක් ඇති වූ බවත්, එම අවස්ථාවේ සභාව මගින් ජල ටැංකි ලබා දුන් බවත්, මෙම වර්ෂයේ එවැනි පොදු අවශ්‍යතා වෙනුවෙන් මුදල් වෙන්කර නොමැති බැවින් ඉහත ගම්වාසීන්ගේ ගැටළුව පිළිබඳ සලකා බැලීම සුදුසු බව පැවසීය.අනතුරුව ගරු සභාපතිතුමන් පැවසුයේ වැඩ අධිකාරී මහතාගෙන් ඉහත ඉදිරිපත් කරන ලද ඉල්ලීමට අදාළව ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ඇස්තමේන්තුවක් ලබා ගෙන ඉදිරි සභාවක් වෙත හෝ මුදල් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවයි.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

**05:01** කර්මාන්ත හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ගංගා වැලි සපයා ගැනීමට අදාළව මිල ගණන් විවෘත කිරීම.

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ජගත් එන්ටර්ප්‍රයිසස්, තිරණ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයර්ස්, කේ.වී.සී ප්‍රොඩක්ට්ස් යන ආයතනයන්ගෙන් මිල ගණන් ඉදිරිපත් වී තිබුණු අතර, වැලි කියුබ් 01 ක් සඳහා අවම මිල ගණන වන රු. 20,500.00 ක මුදල ඉදිරිපත් කළ තිරණ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයර්ස් වෙතින් වැලි ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා කළ යෝජනාව උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**06:01:01** මුගුණමලය ගලපල්ලෙඅරාව මාර්ගය ප්‍රමුඛතාගත ලේඛණයේ කුමන ස්ථානයක පවතීද?මෙම වසරේදී එහි නඩත්තු සිදුවේද?

මුගුණමලය ගලපල්ලෙඅරාව මාර්ගය නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය බැවින් එම මාර්ගය නඩත්තු කිරීම සම්බන්ධව ඉදිරියේදී සලකා බැලිය යුතුය.

**06:01:02** ඉත්තෑගලහේන ඩෙස්මන් මහතාගේ නිවස අසළ හා ඉහළ කොටසේ ජලය බැසයාමේ ගැටළුවට පියවරක් ගෙන ඇත්ද?

ඉත්තෑගලහේන ඩෙස්මන් මහතාගේ නිවස අසළ හා ඉහළ කොටසේ ජලය බැසයාමේ ගැටළුව විසඳීම සඳහා ඉදිරි සංවර්ධන යෝජනා සඳහා ඉදිරිපත් කළ යුතුය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ජ්.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ඉහත ස්ථානයේ ගැටළුව සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් සිදුකිරීම පිළිබඳව ප්‍රශ්නය ඉදිරිපත් කළ බවයි.

ස්ථානීය පරීක්ෂණය පිළිබඳව වැඩ අධිකාරී මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

**06:02 ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**06:02:01** රබර්වත්ත රෝහිණී මහත්මියගේ නිවෙස් අසළ මාර්ගයේ මැද ඇති විදුලි කණුව එක් පසෙකට යොමු කිරීමට විදුලිබල මණ්ඩලය දැනුවත් කර ඇත්ද?එය යොමුකර ඇත්නම් කවදාද?

මේ සම්බන්ධව විදුලි බල මණ්ඩලය දැනුවත් කරමින් 2025-11-10 දිනැතිව ලිපි යොමු කර ඇත.

**06:02:02** මුගුණමලේ දෙවෙනි පටුමඟ නඩත්තු කටයුතු මෙම වර්ෂය තුළ සිදු කරයිද?

මුගුණමලය දෙවැනි පටුමඟ මාර්ගය අන්තරු සම්බන්ධිත ගල් අතුරා සකස් කර ඇති බැවින් කැලය කැපීම නඩත්තු කටයුතු යටතේ සිදු කරනු ලැබේ.

**06:02:03** අනඳමෙත්ගම එඩ්වඩ් මහතාගේ නිවස අසලින් පහළ මාර්ගය සම්බන්ධ කිරීමට ඇති මාර්ගයේ මායිම් හා අනඳමෙතත්ගම ප්‍රජාශාලාව අසලින් ඉහළ මාර්ගයේ චමින්ද තෙන්නකොන් මහතාගේ නිවස අසලින් ජල ටැංකියට ඉදිරිපස මාර්ගයේ මායිම් ලකුණු කර දෙන ලෙස කරන ලද ඉල්ලීම සහ මුගුණමලය අනඳමෙත්ගම මාර්ගය ජාතික මැනුම් ජාලයට ඇතුළත් කිරීම සඳහා කළ යෝජනා ප්‍රදේශීය මැනුම් අධිකාරීය වෙත ඉල්ලීම් කර ඇත්ද?එසේ කර ඇත්නම් එය කවදාද?

මෙම මාර්ගය මැනුම් කිරීම සම්බන්ධව කාර්මික නිලධාරී විසින් ස්ථානීය පරීක්ෂණයක් 2025.11.06 දින සිදු කළ අතර එම මාර්ග පිළිබඳ කැඩැස්තර විස්තර ග්‍රාම නිලධාරීගෙන් ලබා ගැනීමෙන් පසු මැනුම් නියෝග ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරියේදී ඉදිරිපත් කළ යුතුය.

**06:03 ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා**

**06:03:01** 2026 වර්ෂය සඳහා මහජන පොළ පවත්වාගෙන යාමේ කටයුත්ත ගරු සභාව විසින් සිදු කිරීමට තීරණය කරන ලදී.එම එකඟතාවය අනුව 2026 වර්ෂය සඳහා මහජන පොළ පවත්වාගෙන යන ආකාරය සම්බන්ධව ගෙන ඇති තීරණ කවරේද?

2026 වර්ෂයේදී මහජන පොළ පවත්වාගෙන යාමේ කාර්යය සභාව විසින් සිදු කිරීමට නියමිතයි ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු ඉදිරියේදී කටයුතු සිදු කරනු ලැබේ.

**06:03:02** පසුගියදා නිමාකරන්නට යෙදුන පළාත් පාලන සතියට සමගාමීව කසළ රැස්කරන රථ ළඟා වීමට නොහැකි ස්ථාන සඳහා කසළ බඳුන් ලබා දීමට එකඟ වූ නමුත් තවමත් එම කටයුතු සිදු නොවීමට හේතු වාර්තා කරන්න.

කසළ බඳුන් 02ක් පමණක් ලබා දී ඇති අතර ඉතිරි කසළ බඳුන් 18 අදාළ මිල ගණන් ලබාදුන් ආයතනයෙන් ගෙන්වා ගැනීමට ඇණවුම ලබා දී ඇත.

**06:03:03** ළමා උද්‍යානයේ නැවතී ඇති වැඩ කොටස් නිමා කරන ලෙසත් උපකරණ මිලදී ගැනීම සම්බන්ධවත් තවමත් ක්‍රියාත්මක වී නොමැත.හේතු දක්වන්න.තවද ළමා උද්‍යානය පුළුල් කිරීමට සභාවට තිබූ කලබලය වර්තමානයේ හීන වී ගියේ කාගේ බලපෑමක් මතද?

සභා අරමුදලින් ඉටු කිරීමට යෝජනා වී ඇති අතර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.ඒ සම්බන්ධව කිසිඳු බලපෑමක් නොමැත.

මෙම අවස්ථාවේ ළමා උද්‍යානයේ උපකරණ නඩත්තුව හා ළමා උද්‍යානය පුළුල් කිරීමේ කර්මාන්තය සම්බන්ධව වැඩ අධිකාරී මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති කේ.ජී.පේමදාස මැතිතුමා**

**07:01:01** බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ පොදු වැසිකිළියේ ටෙන්ඩර් කාලය 2025.10.31 දිනෙන් අවසන් විය. දැනට එහි සිදුකරමින් පවතින අළුත්වැඩියා කටයුතු අවසන් වූ වහාම මෙම පොදු වැසිකිළිය නඩත්තු කර පවත්වාගෙන යාම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** සභාව සතු පහත කඩ කාමරවල ගිවිසුම් කාලය 2025.12.31 දිනෙන් අවසන් වන බැවින් 2026 වර්ෂය සඳහා අදාළ ගිවිසුම් අත්සන් කිරීමට ගිවිසුම් කෙටුම්පත් සඳහා අනුමැතිය ලබා ගැනීම.

I. නව පදික කඩ කාමර
II. පදික කඩ
III. පොදු වෙළඳසැළ එළවළු කඩ කාමර
IV. පොදු වෙළඳසැළ මාළු කඩ කාමර
V. පොදු වෙළඳසැළ එළ ගව මස් කඩ කාමරය
VI. පොදු වෙළඳසැළ එළු මස් කඩ කාමරය
VII. පොදු වෙළඳසැළ කුකුළු මස් කඩ කාමර
VIII. සාප්පු කඩ
IX. මැණික් කඩ කාමර
X. විවෘත කඩ (කාර් පාර්ක් කඩ)
XI. සභාව සතු දේපළ
XII. රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම
XIII. නව බස් නැවතුම්පොළ කඩ කාමර හා කාර්යාල
XIV. මහජන පොළ ආපනශාලාව
XV. පොළ කඩ
XVI. මහජන පොළ කඩ
XVII. පොළ ගබඩා
XVIII. සම්පත් පියසස යාබද කඩ කාමර
XIX. දැන්වීම් පුවරු

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පෙර සභාවාරයකදී මෙම වාර්ෂික ගිවිසුම් අත්සන් කරනු ලබන කඩ කාමර දීර්සකාලීනව බදු ලබා දීමට අදාළ යෝජනාවක් සම්මත වූ බැවින් එහි තත්වය කුමක්ද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා මේ පිළිබඳ ප්‍රගතිය ලේකම්තුමියගෙන් විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:01:03** සභාව සතු ලීටර් 2500 ගලි බවුසර් රථය සඳහා ගලි ටැංකියක් මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ මෙම ගලි රථයේ නඩත්තු වෙනුවෙන් විශාල පිරිවැයක් දරා ඇති බවත්, පසුගිය සභාවාරයේදීම මේ වෙනුවෙන් රු.685,000ක පිරිවැයක් වෙනුවෙන් අනුමැතිය ලබාගත් බවත්, ඊට පෙර රු.300,000 ක් දැරූ බවත්, ඒ අනුව නව ගලි ටැංකියක් ලබා ගැනීමට එම අවස්ථාවේදීම හැකියාව තිබූ බවත්ය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ගලි රථය අළුත්වැඩියා කළද තවත් ගලි රථයේ ටැංකියේ ලීක් පවතින බව පවසමින් ගලි සේවාව ලබා දීමේ කාර්යය සිදු නොවන බවයි. ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ ගලි ටැංකියේ සිදුකරන ලද අළුත්වැඩියාව සඳහා මාස හයක වගකීම් කාලයක් පවතින බවයි.ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය, එසේනම් එම වගකීම් කාලය තවමත් පවතින බවත්, 2025.09.09 සභාවේදී නව ගලි ටැංකියක් තැබීම සුදුසු බවට පැවසූ බවත්, මෙය මුදල් නාස්තියක් නම් ඒ පිළිබඳ සලකා බැලිය යුතු බවත්ය.

ගරු සභාපතිතුමා, නව ගලි බවුසරයක් සභාවට ඉල්ලුම් කර ඇති බවත් මේ අවස්ථාවේදී මෙම ගලි ටැංකිය ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙසත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:04** කෑගල්ල නගර සභාව මඟින් කම්පැක්ටර් යන්ත්‍රයක් සභාව වෙත නොමිලේ ලබා දීමට කැමැත්ත පළ කර ඇති බැවින් එය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා, මෙම යන්ත්‍රයේ තත්වය පරීක්ෂා කර ලබා ගත යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අප සභාවේ කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ සේවකයන් මඟින් කසළ කළමණාකරණ කටයුතු සිදු කරන බැවින් මෙම යන්ත්‍රය සභාවට ගැලපෙන්නේ නැති බවත් පවසන ලදී.

සභාවේ ට්‍රැක්ටර් රථ සඳහා ලබා දෙනු ලබන කසළ වෙන්කර ලබා දීමේ ප්‍රගතිය 60%-70% ක් පමණ වන බවත්, ඉදිරියේදී එය තව දුරටත් විධිමත් වනු ඇති බැවින්ද මෙම යන්ත්‍රය ඵලදායි වනු ඇති බව ගරු සභාපතිතුමා පැවසීය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පැවසුයේ කම්පැක්ටර් යන්ත්‍රවල ඉන්ධන භාවිතය ඉතා වැඩි බවත්, ලීටරයකට 4km පමණ වන බවත්,මෙම යන්ත්‍රය ලබා දෙන ආයතනවලට එය නඩත්තු කිරීමට ඇති නොහැකියාව මත ලබා දෙනවා විය හැකි බවත්, අතුරු මාර්ගවල මෙම යන්ත්‍රය ධාවනය කළ නොහැකි බවත්, මෙය ලබා ගන්නවාට විරුද්ධවනවා නොව නඩත්තුව පිළිබඳ සලකා බලා ලබා ගැනීම සුදුසු බවත්, RE 2600 ට්‍රැක්ටර් රථය හදලා ගෙනවිත් මාර්ගයට නොදමන්නේ ධාවන සටහනේ ගැටළුවක් හේතුවෙන් බවත්, මීට වඩා එම ට්‍රැක්ටර් රථය කසළ එකතුකිරීමේ කටයුතු සඳහා යෙදවිය හැකිනම් ඒ පිළිබඳ සලකා බැලීම වැදගත් බවත් පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම යෝජනාව පිළිබඳ සභාවේ මතය විමසීම සඳහා සභාවට ඉදිරිපත් කළ බවත්, සභාවේ ඒ පිළිබඳ එකඟත්වයක් නොමැතිනම් එය ලබා ගැනීමේ අත්‍යවශ්‍යතාවයක් නොපවතින බවත්,සභාවේ මතය පිළිගන්නා බවත්, මේ වන විට ට්‍රැක්ටර් රථ පහක් පමණ ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇති බැවින් එම රථ ඉදිරියේදී ලැබෙනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ මෙම කම්පැක්ටර් යන්ත්‍රය පිළිබඳ තත්ව සහතික ලබාගෙන යන්ත්‍රය ලබාගැනීම පිළිබඳ තීරණය කිරීම සුදුසු බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාද පැවසුයේ ඒ පිළිබඳ තත්ව වාර්තාවක් ලබාගෙන යන්ත්‍රය ලබාගැනීම හෝ නොගැනීම පිළිබඳ තීරණය කිරීම සුදුසු බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ එම යන්ත්‍රය පිළිබඳ තත්ව වාර්තාවක් ලබා ගෙන යන්ත්‍රය ලබාගැනීම නොගැනීම පිළිබඳ තීරණය කිරීම සුදුසු බවයි.

**07:01:05** බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා හලර් යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා රු.4,000,000.00ක ඇස්තමේන්තුවක් යටතේ ලබා ගැනිමට අපේක්ෂා කරන බැවින් එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරිමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නිලධාරින් නම් කරන ලද අතර ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

01.කේ.ඩබ්.එම්.ටී.එස්.ආනන්ද මහතා - සභාපති - යාන්ත්‍රික ඉංජිනේරු

02.ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මහතා - සාමාජික - පළාත් පාලන සහකාර කොමසාරිස්

03.කේ.එම්.එස්.සී.වේරහැර මහතා - සාමාජික - නියෝජ්‍ය අධ්‍යක්ෂක (පළාත් පාලන)

04.එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා - සාමාජික - ගණකාධිකාරී (1) (නියෝජ්‍ය ප්‍රධාන ලේකම්,ඉංජිනේරු සේවා )

05.එම්.එන්.පී මුණසිංහ මහතා - සාමාජික - කාර්මික නිළධාරී (බලංගොඩ නගර සභාව)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** බලංගොඩ මහජන බස් නැවතුම්පළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරිම සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණය සම්බන්ධයෙන් ගැටළු පවතීනම් එම ගැටළු ඉදිරිපත් කිරිමට කාලයක් ලබා දී ඇත. ඒ අනුව ලංසු කරුවකු විසින් අභියාචනාවක් ඉදිරිපත් කර ඇති බැවින් එම අභියාචනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කළ යුතුවේ. ඒ අනුව පහත සඳහන් නිළධාරීන් අභියාචනා කමිටුව ලෙස පත් කරනු ලබන බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය සඳහා ලබා ගැනීම.

01.ඩබ්.ඒ.ඩබ්.එල්.හේමන්ත මහතා-සභාපති -පළාත් පාලන ඉංජිනේරු,පළාත් කොමසාරිස් කාර්යාලය

02.එම්.ජී.එස්.ගුණවර්ධන මිය -සාමාජික - ගණකාධිකාරී, නගර සභාව, බලංගොඩ

03.එස්.එන්.කේ.කේ.පී.නාරායන මහතා- සාමාජික - කාර්මික නිලධාරී,පළාත් කොමසාරිස් කාර්යාලය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**විශේෂ යෝජනා -**

**07:01:07** ඉන්ධන බිල්පත් පියවීම වෙනුවෙන් BKJ Petrolium වෙත රු.853,981.72 ක් ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** සභාවේ මාර්ග නඩත්තු කටයුතු සඳහා 80/100 තාර බැරල් 30ක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා**

**07:02:01** බළන්ගොඩ ඉරිදා පොළ භූමියෙහි වෙළඳ කුටි ඉතාමත්ව අවිධිමත්ව පිහිටා ඇත. එබැවින් පොළට පැමිණෙන පාරිභෝගිකයන් මහත් අපහසුතාවයට පත්වේ.එම අපහසුතාවය මඟහැරවීම සඳහා පොළ භූමියෙහි ඇති කඩ කාමර එළවළු සඳහා එක් තීරුවක්ද, රෙදි සඳහා එක් තීරුවක්ද, පළතුරු සඳහා එක් තීරුවක්ද ආදී වන ලෙස බෙදා වෙන් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමන් පැවසුයේ ඉහත යෝජනාවේ ආකාරයටම පොළ සැකසීම ප්‍රායෝගික නොවන්නේ නම් පාරිබෝගිකයන්ට පහසුවෙන් භාණ්ඩ ලබා ගත හැකි සුදුසු විධිමත් ආකාරයකට සකස් කිරීමට යෝජනා කරන බවත්, දැනට පවතින ආකාරය අවිධිමත් බවක් පෙන්නුම් කරන බවත්ය.

ගරු සභාපතිතුමන් 2026 වර්ෂයේදී සතිපොළ පැවැත්වීමේ කටයුතු සභාව මඟින් සිදු කිරීමට නියමිත බැවින් ඉදිරියේදී විධිමත් ආකාරයට සකස් කිරීම් සිදු කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:02** බළන්ගොඩ නගරය හරහා ගමන් කරන දුර සේවා බස් රථ වලින් බළන්ගොඩ ප්‍රධාන බස්නැවතුම්පොළ අසළ දුර සේවා බස්නැවතුම්පොළේදී සහ ඔරලෝසු කණුව අසළ බස්නැවතුම්පොළේදී කප්පම් ගැනීම තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.මේ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කර එම ගැටළුව ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් මෙහිදී ඉහත ගැටළුව පිළිබඳව පොලිසිය හා මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බවට පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:03** බළන්ගොඩ නගර සභා සීමාව තුළ සෑම ග්‍රාම සේවා වසමක්ම ආවරණය වන පරිදි එම වසම්වල ක්‍රියාත්මක වන සමිති සමාගම්වල දැන්වීම් ඇලවීම සඳහා සුදුසු ස්ථාන වල දැන්වීම් පුවරු සවිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමන් පැවසූයේ ග්‍රාමීය මට්ටමින් වැඩිහිටි සමිති, කොට්ඨාශ සභා, ප්‍රජා ශක්ති සමිති,මහජන ආරක්ෂක කමිටු ආදී සමිති සමාගම් ක්‍රියාත්මක වන බවත්, ඒවායේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට නිශ්චිත ස්ථානයක් නොමැති බැවින් කුඩා ප්‍රමාණයේ දැන්වීම් පුවරුවක් ස්ථාපිත කිරීම අදහස් කළ බවත්ය.

ගරු සභාපතිතුමන් පැවසූයේ එවැනි ප්‍රදර්ශන පුවරු බොහොමයක් සේවා පියස ස්ථාපිත කර ඇති ස්ථාන වල පවතින බවත් එසේ නොමැති ස්ථාන පිළිබඳව සභාපතිතුමන් දැනුවත් කිරීමට කටයුතු කර ඉන් පසුව ඒ පිළිබඳව සලකා බැලිය හැකි බවත්ය.

**07:03 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:03:01** පසුගිය මස රු.1,584,742.66 දෛනික වැටුප් ගෙවීම සිදු කරන ලද්දේ කුමන කටයුතු සම්බන්ධයෙන්ද යන්න සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, 2025 සැප්තැම්බර් මස දෛනික වැටුප් වාර්තාව අනුව බැංකියවත්ත කසළ අංගනය වෙනුවෙන් මිනිස් දින 432.5 ක ප්‍රමාණයක් වැය කර ඇති බවත්, ඩබ්.ඒ සමරදාස යන අය සේවයේ යෙදවීම පිළිබඳවත් විමසීම් කරන ලදුව ඒ පිළිබඳ ගණකාධිකාරිතුමියගෙන් සහ වැඩ අධිකාරී මහතාගෙන් වැඩිදුර කරුණු පැහැදිලි කර ගැනීම් වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන්

සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදි.

**07:03:02** මෙම වර්ෂයේ ජූලි ,අගොස්තු, සැප්තැම්බර්,මස ඉන්ධන සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණයන් සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පහත පරිදි 2025 වර්ෂයේ ඉන්ධන වියදම සභාවට ඉදිරිපත් කරන ලදී.

| **මාසය** | **වියදම ( රු.)** |
|---|---|
| ජූලි | 794,306.95 |
| අගෝස්තු | 849,739.17 |
| සැප්තැම්බර් | 980,987.01 |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සාපේක්ෂව ඉන්ධන වියදම වැඩිවීමක් දක්නට ලැබෙන බවත්, ඒ අනුව පිරිවැය කළමණාකරණය කර ගැනීම පිළිබඳ අවධානය යොමුකළ යුතු බවත් පවසන ලදී.

**07:04 ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:04:01** බුද්ධ ජයන්ති මාවතට හැරෙන ස්ථානයේ දොරවෙල පළමුවන පටුමඟේ පඩිපෙළ අසළ ,දේගපිටිය බෝධිය අසළ සූර්යය පැනල 3ක් සවිකිරීම.2025.09.09 අනුමත වූ යෝජනාවේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් පැවසූයේ 2025.09.09 දිනැති මහ සභාවේ අනුමත වූ යෝජනා වලින් 06:03:02 යෝජනාවට අදාළව විදුලි බල මණ්ඩලය වෙත ලිපි නිකුත් කර ඇති බවත්, 06:03:03 සහ 06:03:04 යන යෝජනා වලට අදාළව ඉදිරියේදී කටයුතු කිරීමට නියමිත බවත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:02** අංක 49,අනදමෙත්ගම නිවෙස්වලට යන මාර්ගයේ නඩත්තු කටයුතු වල තත්වය පිළිබඳ සාකච්ඡා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුයේ අනදමෙත්ගම මාර්ගය අළුත්වැඩියා කටයුතු වලට අදාළව වැඩ අවසන් අදියරේ තිබෙන බවත්,2වන තාර දැමීම සිදු කළ යුතුව පවතින බවත්ය.

**07:05** **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

**07:05:01** සඳුන්ගම වතුර ටැංකිය අසළ ප්‍රේමලතා මහත්මියට නිවසක් සාදාදීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ මෙම යෝජනාව අනුමත වී තුඹගොඩ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් කව්රුන් හෝ හරහා මෙය ඉටුකරනවානම් එය ගැටළුවක් නොවන බවත්,මෙහි ස්ථිනීය පරීක්ෂණයක් අවශ්‍ය නම් සිදු කරන ලෙසත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ රජයේ සැමට නිවසක් ව්‍යාපෘතිය යටතේ බළන්ගොඩ ප්‍රදේශයේ නිවාස පහසුකම් අඩු ජනතාව වෙත මේවන විට නිවාස 15ක් පමණ ලබා දී ඇති බවත්, එම ව්‍යාපෘතිය මඟින් නිවාස 30ක් පමණ අනුමත වී ඇති බවත්, නිවාස අධිකාරිය සමඟ සම්බන්ධ වී එම කටයුතු සිදු වන බවත්, එහි නිර්ණායක යම් ප්‍රමාණයක් පවතින බවත් ඒ අනුව ඉහත නම සඳහන් අයද එම නිර්ණායක සපුරන්නේ නම් එම ව්‍යාපෘතිය සඳහා යොමු කිරීමටත් ඉදිරි කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව රජයේ "සැමට නිවසක් ව්‍යාපෘතිය" වෙත යොමු කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:02** රිෂානා ජෙම් පැලස් අසළ මර්සූක් මහත්මයාගේ නිවස මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06** **ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**07:06:01** බළන්ගොඩ තානායම සඳහා ඉදිරියේදී කටයුතු කිරීම පිළිබඳව දැනුවත් කිරීම.

ඒ අනුව මෙහිදී ගරු සභාපතිතුමන් විසින් බළන්ගොඩ නගර සභාව සතු තානායම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවත්නා ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් යන ආයතනයට පවරා ගැනීමට සභාවේ විරුද්ධත්වය දැන්වීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ ගරු සභාපතිතුමා පසුගිය සභාවේදී තානායම පවරා ගැනීම සම්බන්ධව විශේෂ මහ සභාවක් කැඳවා සාකච්ඡාවක් සිදු කරන බව පැවසූ නමුත් එම කිසිඳු සාකච්ඡාවක් නොපවත්වාම තානායම පවරා ගැනීමට ඉඩ දීමට යන බවත්, නාගරික මන්ත්‍රීවරු ලෙස ඒ පිළිබඳව අදහස් දැක්වීමට එම අවස්ථාව නොදුන් බවත්, ඒ අනුව මේ අවස්ථාවේදී බළන්ගොඩ තානායම සභාව මඟින් පවත්වා ගෙන යාමට යෝජනා කරන බවත් පවසන ලදී.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ සභාව සතු තානායම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවත්නා ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් යන ආයතනය මඟින් පවත්වාගෙන යාමට කටයුතු කරන බවත්,නමුත් සභාව මඟින් තානායම බදු දීම කළ හැකිව පවතින බවත්, තමන් දන්නා පරිදි ගරු ජනාධිපතිතුමා එලෙස තානායම් බදුලබා දීම පිළිබඳව තීරණය කර නොමැති බවත්, ඒ අනුව ගරු සභාවේ තීරණයක් ලබා ගෙන සභාවට අහිමිවීමට යන ආදායම නැවත සභාව වෙත ලබා ගැනීමට කටයුතු කිරීමට යෝජනා කරන බවත් පවසන ලදී.

ඒ අනුව තානායම සම්බන්ධව සභාවේ ඇති වූ සාකච්ඡාවෙන් පසුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, තානායම සභාව මඟින් ටෙන්ඩර් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:02** බළන්ගොඩ කොට්ඨාශය ගල්වල පාර සිට වතුකාරගොඩ දක්වා කාණු සුද්ධ කිරීම සහ දෙපස කැලෑව සුද්ධ කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා සලකා බැලීම**

2025-10-22 දින පැවති මුදල් කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර එකී වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2025 සැප්තැම්බර් ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.11,580,371.47 |
| මූලධන ලැබීම් | රු.490,659.19 |
| වෙනත් ලැබීම් | රු.2,501,811.80 |
| මුළු ලැබීම් | රු.14,572,842.46 |
| පුනරාවර්තන වියදම් | රු.14,326,546.99 |
| ප්‍රාග්ධන වියදම් | රු.3,710,348.31 |
| වෙනත් වියදම් | රු.2,743,490.23 |
| මුළු වියදම් | රු.20,780,385.53 |

**2025 ඔක්තෝම්බර් ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුදල රු. |
|---|---|
| **227-5020** | 22,437.00 |
| **RD -8240** | 37,123.54 |
| **226-7521** | 41,569.39 |
| **BC-0005** | 66,480.00 |
| **GC-0001** | 17,950.00 |
| **LL-7688** | 27,700.00 |
| **DDR-0008** | 2876.00 |
| **JD-4684** | 1495.00 |
| **LL-2110** | 11,933.00 |
| **MM-8152** | 1495.00 |
| **ND-5124** | 53,195.08 |
| **PF-4006** | 48,475.00 |

| | |
|---|---|
| **RC-1107** | 12,188.00 |
| **VI-1833** | 2990.00 |
| **RB-4786** | 53,084.77 |
| **RC-1118** | 14,406.77 |
| **ZA-5039** | 71,468.77 |
| **GK- 1483** | 77,463.54 |
| **RD -8000** | 25,486.77 |
| **GK-6227** | 53,186.77 |
| **ZA 9835** | 89,692.77 |
| **HF-7899** | 25,936.00 |
| **MG-0014** | 16,620.00 |
| **RC-8183** | 63,478.30 |
| **UQ-1933** | 2392.00 |
| එකතුව | **836,628.47** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

මෙදින සභාවේ පෞද්ගලික මන්ත්‍රී පැහැදිලිකිරීම් ඉදිරිපත් නොවීය.

**11. අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා සහ විශේෂයෙන් සභාව සාර්ථකව පවත්වා ගෙන යාමට නිරන්තර උපදෙස් ලබා දෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා වෙතද ස්තූතිය පුදකරමින් ප.ව.2.00ට පමණ මෙදින මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

කේ.ජී.පේමදාස,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.